© සියලු ම හිමිකම් ඇවිරිණි.

අනු අංකය: ………………

# සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය (ශ්‍රී ලංකා)

## තාක්ෂණික අදියර

## 2008 මාර්තු විභාගය

| | | | |
|---|---|---|---|
| විභාග දිනය | : 2008 මාර්තු 02 | පිටු ගණන | : 06 |
| විභාග වේලාව | : ප.ව. 1.30 - ප.ව. 4.30 | ප්‍රශ්න ගණන | : 09 |

***අයදුම්කරුවන්ට උපදෙස්:***

1. වෙන්කළ කාලය පැය 03 යි.
2. I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II කොටසේ 'අ' ඛණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද, 'ආ' ඛණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද (මුළු ප්‍රශ්න 5) පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සිංහල භාෂාවෙන් සපයන්න.

| **විෂය** | **විෂය සංකේතය** |
|---|---|
| **ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර** | **ECN** |

---

### I කොටස

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

1 ප්‍රශ්නයේ සියලුම කොටස්වලට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම වඩාත්ම නිවැරදි උත්තරය තෝරාගෙන එහි අංකය හා ඉංග්‍රීසි අක්ෂරය ඔබට සපයා ඇති පිළිතුරු පොතේ ලියන්න.
උදා: (1) a, (2) b ආදී වශයෙන්

(1) පහත ඒවායින් කුමක් වෙළෙඳපොළ අර්ථ ක්‍රමයේ වාසියක් ලෙස සැළකේ ද?

(a) සම ආදායම් ලබාදීම පිණිස අරමුණු කර තිබීම.
(b) එමගින් නිෂ්පාදනය සඳහා දිරියක් ලබාදීම.
(c) ආරක්ෂාව, නීතිය හා විනය ඇති කිරීම සහතික වීම.
(d) පරිසර දූෂණය හා තදබදය අඩු කරලීම.

(2) සැලසුම් අර්ථ ක්‍රමයක බොහෝවිට පාරිභෝගික භාණ්ඩ ලබාගැනීමට දිග පෝලිම් දක්නට ලැබේ. පහත සඳහන් වාක්‍යවලින් කුමක් ඒ ගැන සඳහන් වේද?

(a) භාණ්ඩ බෙදාහැරීම අකාර්යක්ෂමයි.
(b) නිෂ්පාදන සාධක නිදහසේ චලනය විය හැක.
(c) ලාභ උපරිම වන ආකාරයට පිටවුම් පිළිබඳ තීරණ ගනී.
(d) නිෂ්පාදනය නිගමනය වන්නේ පාරිභෝගික අවශ්‍යථා අනුව ය.

(3) වෛද්‍යවරුන් ෂතර දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමකට පහත දක්වෙන ව්‍යාපාර සංවිධානවලින් කුමක් වඩාත්ම සුදුසු යැයි සැළකිය හැකි ද?

(a) හවුල් ව්‍යාපාරයක්
(b) පෞද්ගලික සමාගමක්
(c) පොදු සමාගමක්
(d) රාජ්‍ය සංස්ථාවක්

(4) ලොව පුරා පරිගණක නිපදවන සමාගමක කොටස් මේසන් මහතා මිලට ගත්තේ ය. සිල්ලර බඩු ගබඩාවක් අයිති ඩීන් මහතා එය පවත්වාගෙන යයි. පහත සඳහන් ඒවායින් කුමක් එම ව්‍යාපාර ගණයට අයත් නොවන්නේ ද?

(a) සමූපකාරය
(b) බහු ජාතික සමාගම
(c) පොදු සමාගම
(d) කේවල ස්වාමි ව්‍යාපාරය

(5) තම සාමාජිකයින්ගේ වැටුප් වැඩි කරගැනීමේ සාකච්ඡාවල දී වෘත්තීය සංගම් ඵලදායී වන්නේ,

(a) ආර්ථික පරිහාණියක් ඇති විට
(b) ආර්ථික වෘද්ධියක් ඇති විට
(c) නිෂ්පාදනය පහළ යන කාලපරිච්ඡේදයක දී
(d) සේවා වියුක්තිය ඉහළ යන කාලපරිච්ඡේදයක දී

(6) පහත සඳහන් ඒවායින් මහ බැංකුව හා වාණිජ බැංකු පොදුවේ ඉටු නොකරන කාර්යය කුමක් ද?

(a) මූල්‍ය ප්‍රතිපත්තිය පාලනය කිරීම.
(b) බැංකුකරුවන්ගේ බැංකුව ලෙස කටයුතු කිරීම.
(c) විදේශ විනිමය කටයුතු කිරීම.
(d) බැකු කටයුතු අධීක්ෂණය කිරීම.

(7) පහත සඳහන් රූප සටහනෙන් දැක්වෙන්නේ ඉරිඟු වෙළෙඳපොළ සමතුලිතයයි.




ඉරිඟු ගොවීන්ගේ ආදායම කුමන වර්ගඵලයෙන් දැක්වේ ද?

(a) ATXY
(b) OWXD
(c) OVXY
(d) OWXY

(8) කාර් නිෂ්පාදනයේ දී රජය විසින් බද්දක් අයකරනු ලැබුවහොත් පහත සඳහන් ඒවායින් කුමක් අඩු වේද?

(a) කාර් සැපයුම් පිරිවැය
(b) කාර් මිල
(c) රජයේ ආදායම
(d) සෑම මිලක් යටතේම කාර් සැපයුම

(9) පාන් සඳහා ඇති ඉල්ලුම $D_1$ සිට $D_2$ දක්වා වෙනස්වීම කෙරෙහි පහත සඳහන් ඒවායින් කුමක් බලපායි ද?



(a) පාන් නිෂ්පාදන පිරිවැය අඩු වීම.
(b) පාන්වල විකල්පයක මිල අඩු වීම.
(c) පාන් කෑම සෞඛ්‍යයට හිතකර බව පුවත්පතක පළවීම.
(d) පාන්වල අනුපූරකයක මිල ඉහළ යෑම.

(10) තරඟකාරී කර්මාන්තයක මිල ඒකාධිකාරයට වඩා අඩු වේ. පහත දැක්වෙන වාක්‍යවලින් කුමක් ඒ ගැන සඳහන් වේද?

(a) වෙළෙඳපොළ කෙරෙහි ඒකාධිකාරයට ඇති බලපෑම අඩු ය.
(b) තරඟකාරී කර්මාන්තයක ආර්ථික පිරිමැසුම් වැඩි ය.
(c) තරඟකාරී වෙළෙඳපොළකට අලුත් ව්‍යාපාරවලට ඇතුල් විය හැකි ය.
(d) ඒකාධිකාරයක ලාභ අඩු ය.

(11) සමාගම් හතරක ඉල්ලුම් රේඛා දැක්වෙන පරිදි පහත සඳහන් ප්‍රස්ථාර සමාන පරිමාණයට ඇඳ ඇත. වෙළෙඳපොළ මිල $ 10 කි. මිල $ 8 දක්වා අඩුවීම පහත සඳහන් ඒවායින් කුමක් නිරූපණය වේද?




(a) A ව්‍යාපාරය
(b) B ව්‍යාපාරය
(c) C ව්‍යාපාරය
(d) D ව්‍යාපාරය

(12) අඩු පරිමාණ වැටුප් දැක්වෙන සංයෝගය කුමක් ද?

| | සැපයුම | ඵලදායීතාවය |
|---|---|---|
| A | පහළ යයි | පහළ යයි |
| B | පහළ යයි | පහළ යයි |
| C | ඉහළ යයි | පහළ යයි |
| D | ඉහළ යයි | ඉහළ යයි |

(a) A
(b) B
(c) C
(d) D

(13) ඇඳුම් නිපදවන විශාල නිෂ්පාදකයෙකු සිල්ලර ව්‍යාපාර මිලට ගෙන තම ව්‍යාපාර පුළුල් කළේ ය. පහත සඳහන් ඒවායින් කුමක් ඒ සඳහා උදාහරණයක් වේද?

(a) විවිධාංගීකරණය
(b) බාහිර ආර්ථික පරිමාණුකූල ඵල
(c) සිරස් සංයෝජන
(d) තිරස් සංයෝජන

(14) රටේ ආර්ථික වෘද්ධියක් ඇති බවට පුවත්පතක් වාර්තා කොට ඇත. ආර්ථික විද්‍යාඥයෙකුට මෙයින් අදහස් වන්නේ කුමක් ද?

(a) නිෂ්පාදනය වැඩි වී ඇති බව
(b) ජනගහනය වැඩි වී ඇති බව
(c) ඉතිරිකිරීම් වැඩි වී ඇති බව
(d) බදු වැඩි වී ඇති බව

(15) රටක් උද්ධමන කාලපරිච්ඡේදයකට ලක් වෙමින් පවතී. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් ඒවායින් කුමක් වැඩි වෙමින් පවතී ද?

(a) වැටුප් මට්ටම්
(b) භාණ්ඩ හා සේවා නිමැවුම
(c) භාණ්ඩ හා සේවා සඳහා වියදම් කළ මුදල් ප්‍රමාණය
(d) භාණ්ඩ හා සේවා මිල

(16) උපත් අනුපාතය අඩුවන්නේ නම් පහත සඳහන් ඒවායින් කුමක් එම කාලයේ රටක ජනගහනය වැඩිවීම කෙරෙහි බලපායි ද?

(a) සාඵල්‍යතා අනුපාතය පහළ වැටීම
(b) ළදරු මරණ අනුපාතය පහත වැටීම
(c) ශුද්ධ ධන සංක්‍රමණය
(d) ශුද්ධ ඍණ සංක්‍රමණය

(17) ජාත්‍යන්තර විශේෂ ප්‍රාගුණ්‍යය කෙරෙහි පහත සඳහන් ඒවායින් කුමක් වාසිදායක වේද?

(a) තෝරාගැනීම සීමිත ය.
(b) රටවල් වඩාත් බැඳියාවකට යටත් වේ.
(c) කාර්යක්ෂම සම්පත් උපයෝජනය.
(d) පරිවහන පිරිවැය අඩු වීම.

(18) බාහිර පිරිවැය අඩු කිරීම සඳහා පහත සඳහන් ඒවායින් කුමක් බද්දට යටත් කළ යුතු ද?

(a) පාපැදි
(b) බස් ගාස්තු
(c) කාර් රථ
(d) දුම්රිය

(19) ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති වෙනුවට සැපයුම් සම්බන්ධ ප්‍රතිපත්ති ආදේශ කර ඇත. මෙයට අඩංගු වන්නේ,

(a) සමාහාර ඉල්ලුම
(b) ඌණිතා මූල්‍යනය
(c) නිවැරදි මූල්‍යකරණය
(d) උද්ධමනය

(20) ස්වභාවික උද්ධමන අනුපාතය නොවෙනස්ව පවතින්නේ,

(a) උද්ධමනය සමඟ ය.
(b) ආර්ථිකය සමතුලිත වීම සමඟ ය.
(c) පිලිප්ස් වක්‍රය සමඟ ය.
(d) සමාහාර ඉල්ලුම සමඟ ය.

*(ලකුණු 01 x 20 = මුළු ලකුණු 20)*

## II කොටස

### "අ" ඛණ්ඩය

**<u>ප්‍රශ්න අංක 02</u>** *(ලකුණු 20)*

(a) සෑම ආර්ථිකයකම මූලික ප්‍රශ්න සමාන වේ. වෙනස් වන්නේ එම ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය අනුව ය. මිශ්‍ර අර්ථ ක්‍රමයක මේ ප්‍රශ්න විසඳා ගන්නේ කෙසේ ද? *(ලකුණු 10)*

(b) කොමියුනිස්ට් අර්ථ ක්‍රම බිඳ වැටී නව ආර්ථික ප්‍රතිපත්ති යොදා ගැනීමට සිදු වූයේ ඇයි ද යන්න දක්වන්න. *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

## <u>ප්‍රශ්න අංක 03</u> *(ලකුණු 20)*

(a) අසමතුලිත මිල යනු කුමක් ද? *(ලකුණු 05)*

(b) නිදහස් වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක මිල යන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? *(ලකුණු 10)*

(c) ඉල්ලුම් වක්‍රයක් දිගේ ගමන් කිරීම හා ඉල්ලුම් වක්‍රයක් වැතින්වීම යන්නෙහි වෙනස කුමක් ද? *(ලකුණු 05)*
*(මුළු ලකුණු 20)*

## <u>ප්‍රශ්න අංක 04</u> *(ලකුණු 20)*

(a) ඉල්ලුමේ ආදායම් නම්‍යතාමය නිර්වචනය කරන්න. *(ලකුණු 06)*

(b) මිල රු. 5 සිට රු. 3 දක්වා අඩු වූ විට ඉල්ලුම ඒකක 15 සිට 20 දක්වා වෙනස්වීමේ මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න. *(ලකුණු 06)*

(c) ඉල්ලුම් නම්‍යතාවය කෙරෙහි බලපාන සාධක විස්තර කරන්න. *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

## <u>ප්‍රශ්න අංක 05</u> *(ලකුණු 20)*

(a) මහ බැංකුවේ කාර්යයන් විස්තර කරන්න. *(ලකුණු 10)*

(b) උද්ධමනය පාලනය කිරීම සඳහා මහ බැංකුව යොදාගන්නා පාලන කම මොනවා ද? *(ලකුණු 05)*

(c) උද්ධමනය පාලනය කිරීමේ අවශ්‍යතාවය කුමක් ද? *(ලකුණු 05)*
*(මුළු ලකුණු 20)*

*"අ" ඛණ්ඩයේ අවසානය*

**"ආ" ඛණ්ඩය**

## <u>ප්‍රශ්න අංක 06</u> *(ලකුණු 20)*

(a) පෞද්ගලීකරණය යනු කුමක් ද? *(ලකුණු 04)*

(b) බොහෝ රටවල් පෞද්ගලීකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ඇයි? *(ලකුණු 10)*

(c) රාජ්‍ය ව්‍යාපාරවල වාසි මොනවා ද? *(ලකුණු 06)*
*(මුළු ලකුණු 20)*

## <u>ප්‍රශ්න අංක 07</u> *(ලකුණු 20)*

(a) ගෝලීයකරණය යනු කුමක් ද? *(ලකුණු 04)*

(b) බහු ජාතික සමාගම්වලින් රටකට ඇති වාසි මොනවා ද? *(ලකුණු 08)*

(c) බහු ජාතික සමාගම් රටකට කරදරයක් වන්නේ කෙසේ ද? *(ලකුණු 08)*
*(මුළු ලකුණු 20)*

**<u>ප්‍රශ්න අංක 08</u>** *(ලකුණු 20)*

(a) ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය ඇඳ විස්තර කරන්න. *(ලකුණු 08)*

(b) ජාතික ආදායම පිළිබඳ දත්ත ගණනය කිරීමේ වාසි මොනවා ද? *(ලකුණු 08)*

(c) ජාතික ආදායම ගණනය කිරීමේ දී මුහුණපාන ගැටලු හතරක් සඳහන් කරන්න. *(ලකුණු 04)*
*(මුළු ලකුණු 20)*

**<u>ප්‍රශ්න අංක 09</u>** *(ලකුණු 20)*

(a) රජයක ප්‍රධාන මූල්‍ය ප්‍රභවයන් විස්තර කරන්න. *(ලකුණු 10)*

(b) ආණ්ඩුවකට අයවැය ලේඛණයක් වඩා වැදගත් වන්නේ ඇයි? *(ලකුණු 04)*

(c) රජයක ප්‍රධාන වියදම් අයිතමයන් මොනවා ද යන්න විස්තර කරන්න. *(ලකුණු 06)*
*(මුළු ලකුණු 20)*

*''අ'' ඛණ්ඩයේ අවසානය*
*II කොටසේ අවසානය*

*ප්‍රශ්න පත්‍රයේ අවසානය*